# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2444/19 – 2025 ජූලි මස 08 වැනි අඟහරුවාදා – 2025.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 406, මිරිස්ස දකුණ 1 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මිරිස්ස දකුණ 1 ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/WLG/2023/396 හා 2023.12.07 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – දොඹගහවත්ත සහ දොඹගහකොරටුව *නොහොත්* දොඩම්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1963**

උතුරට: පුනම් ක්‍රිස්තෝම්බුගේ ශිරාණි හිමිකම් කියන තෙවරාහැන්නදිගෙවත්ත, සවුන්ද්‍ර හැන්නදිගේ හේමාවතී හිමිකම් කියන පොකුණේවත්ත, ගලපත්තිගේ ප්‍රසන්න හිමිකම් කියන පොකුණේවත්ත සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි කොට්ටගහවත්ත; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි නදෝගෙ අම්මගෙවත්ත *හෙවත්* පරණගෙදරවත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය; බටහිරට: වජින්ද පුංචිහේවා හිමිකම් කියන තුම්බෝධිගෙවත්ත *හෙවත්* තෙවරාහැන්නදිගෙවත්ත, හිමිකම් කියන අය සොයාගත නොහැකි තුම්බෝධිගෙවත්ත *හෙවත්* තෙවරාහැන්නදිගෙවත්ත, වරාය පාර, එච්. එච්. පැතුම් සංජීව හිමිකම් කියන දොඹගහකොරටුව *නොහොත්* දොඩම්ගහවත්ත සහ පුනම් ක්‍රිස්තෝම්බුගේ ශිරාණි හිමිකම් කියන තෙවරාහැන්නදිගෙවත්ත.

කේ. ඩී. ලාල් කාන්ත,<br>කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ<br>වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/23/2023/WR/87.<br>2025 මැයි මස 20 වැනි දින,<br>කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,<br>“මිහිකත මැදුර”,<br>රජමල්වත්ත පාර,<br>බත්තරමුල්ල.

EOG 07 – 0083

1A – G 044770 – 14 (2025/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*